

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථාවේ 41ඊ (1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු
ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ හත්වැනි වාර්තාව

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்
அரசியலமைப்பின் 41ஏ (1) எனும் உறுப்புரையின் கீழ்
சமர்ப்பிக்கப்பட்ட, அரசியலமைப்புப் பேரவையின்
ஏழாவது அறிக்கை

The Seventh Report of the Constitutional Council submitted under Article 41G (1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඌ (1) ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ හත්වැනි වාර්තාව

අන්තර්ගතය

1. හැඳින්වීම 1

2. සභාවේ රැස්වීම් 1

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **41**ආ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් 1

3.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව 1

3.2. ජාතික පොලිස් කොමිෂන් සභාව 1

3.3. විගණන සේවා කොමිෂන් සභාව 1

3.4. මුදල් කොමිෂන් සභාව 2

3.5. සීමා නිර්ණය කොමිෂන් සභාව 2

3.6. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව 2

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **41**ඇ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් 2

4.1. විගණකාධිපති ධුරයට පත් කිරීම 2

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත පනවා ඇති හෝ පවරා ඇති කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම 2

5.1. අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික ධුරයට පත් කිරීම 2

5.2. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම ... 3

5.3. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම 3

6. සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධ රීති සකස් කිරීම 3

7. **2016** අංක **12** දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ යොමු කරනු ලබන තොරතුරු ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම 4

1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේමින් ඉදිරියට ('ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව' ලෙසින් ද හඳුන්වනු ලබන), ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට (මින් ඉදිරියට 'සභාව' ලෙසින් ද හඳුන්වනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අනෙකුත් නීති මගින් පවරන ලද කාර්ය සහ කර්තව්‍යයන් කිරීමට සහ ඉටු කිරීමට නියම කර ඇත. 2026 ජනවාරි සිට මාර්තු දක්වා කාලසීමාව තුළ සභාව විසින් කරන ලද සහ ඉටු කරන ලද කාර්යයන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (1) ව්‍යවස්ථාව යටතේ මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

2. සභාවේ රැස්වීම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ, පහත සඳහන් දිනවල දී අවස්ථා හයක දී රැස් විය:-

2026.01.26, 2026.01.30, 2026.02.03, 2026.02.19, 2026.03.06 සහ 2026.03.19

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන්

3.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වත්මන් සාමාජිකයින් හය දෙනෙකුගේ (06) ධුර කාලය 2026 අප්‍රේල් මාසයේදී අවසන් වන බව 2026.03.06 දින පැවති රැස්වීමේදී, සභාව විසින් නිරීක්ෂණය කරන ලද අතර, සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබ ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැනට පවතින පුරප්පාඩු දෙකක් ද නිරීක්ෂණය කරන ලදී.

ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (1) සහ (3) ව්‍යවස්ථා යටතේ සභාව විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉදිරියේදී ඇති වන පුරප්පාඩු සඳහා පත් කිරීම සලකා බැලීම පිණිස සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කරන ලදී.

3.2. ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙහි 2026.05.16 දින සිට ඇතිවීමට නියමිත පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමට සභාව තීරණය කරන ලදී.

3.3. විගණන සේවා කොමිෂන් සභාව

විගණන සේවා කොමිෂන් සභාවේ වත්මන් සාමාජිකයන්ගේ ධුර කාලය 2026.03.31 දිනෙන් අවසන් වන බව 2026.01.30 දින පැවැති රැස්වීමේ දී, සභාව නිරීක්ෂණය කරන ලද අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ (1) සහ 41ආ ව්‍යවස්ථා යටතේ විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙහි ඉදිරියේ දී ඇතිවීමට නියමිත පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී.

ඒ අනුව, අයදුම්පත් ලැබීමෙන් අනතුරුව, සභාව විසින් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදී.

3.4. මුදල් කොමිෂන් සභාව

මුදල් කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙහි 2026.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමට සභාව විසින් තීරණය කරන ලදී.

3.5. සීමා නිර්ණය කොමිෂන් සභාව

සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙහි 2026.05.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇතිවීමට නියමිත පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමට සභාව විසින් තීරණය කරන ලදී.

3.6. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

ඩී. ඒ. පියසිරි දරණගම මහතා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වීම දන්වමින්, ජනාධිපති ලේකම්වරයා වෙතින් ලැබුණු සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ වත්මන් සාමාජිකයන්ගේ ධුර කාලය 2026.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් වන බව ද 2026.01.30 දින පැවැති රැස්වීමේදී සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාව යටතේ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ දැනට පවතින පුරප්පාඩුව සහ ඉදිරියේදී ඇතිවීමට නියමිත පුරප්පාඩු සඳහා පත්කිරීමට සලකා බැලීම සඳහා සැලකිල්ලට ගැනීම පිණිස සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවීමට සභාව විසින් තීරණය කරන ලදී.

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව යටතේ සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන්

4.1. විගණකාධිපති ධුරයට පත් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති ධුරය සඳහා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය සභාව විසින් සලකා බලන ලදී.

සලකා බැලීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 සහ 41ඇ (1) ව්‍යවස්ථා යටතේ, එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති ධුරය සඳහා පත් කිරීමට ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ (1) ව්‍යවස්ථාව යටතේ සභාව විසින් අනුමත කරන ලදී.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර වෙනත් ලිඛිත නීති මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත පනවා ඇති හෝ පවරා ඇති කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම

5.1. අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික ධුරයට පත් කිරීම

පරාක්‍රම ජයන්ත කුමාර් සිල්වා විජේවංශ වික්‍රමසිංහ මහතාගේ ධුර කාලය අවසන් වීමත් සමඟ අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික ධුරයෙහි ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා සභාව විසින් අයදුම්පත් කැඳවන ලද අතර, ඒ අනුව කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී.

2016 අංක 14 දරන අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (ස්ථාපිත කිරීම, පරිපාලනය සහ කාර්යයන් ඉටුකිරීම) පනතේ 4 (2) වගන්තිය ප්‍රකාරව වන අවශ්‍යතා සහ සම්මුඛ පරීක්ෂණවලදී අපේක්ෂකයින්ගේ කාර්ය සාධනය සලකා බැලීමෙන් අනතුරුව, අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජික ධුරයෙහි ඇති වී තිබෙන පුරප්පාඩුව සඳහා ඉහත කී පනතේ 4 වගන්තිය ප්‍රකාරව, පුන්නියමූර්ති ජෙයදීපා මහත්මිය පත් කිරීමට සභාව විසින් නිර්දේශ කරන ලදී.

5.2. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට පත් කිරීම

ලියනආරච්චිලාගේ ජගත් බණ්ඩාර ලියනආරච්චි මහතා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයෙන් ඉල්ලා අස්වීම දන්වමින්, ජනාධිපති ලේකම්වරයා වෙතින් ලද සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

එබැවින්, ඉහත කී පුරප්පාඩුව පිරවීම සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12 (1)(ඇ) වගන්තිය ප්‍රකාරව වෙනත් සිවිල් සමාජ සංවිධාන ප්‍රභේද යටතේ සභාව විසින් නාමයෝජනා කැඳවන ලද අතර, ඒ අනුව එකී නාමිකයන් සභාව විසින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන ලදී.

අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාවය ද, කොමිෂන් සභාවේ සංයුතිය තුළ බහුත්ත්ව නියෝජනයේ වැදගත්කම ද සලකා බලමින්, ජගත් බණ්ඩාර ලියනආරච්චි මහතාගේ ඉල්ලා අස්වීමෙන් 2026.02.01 දින සිට ඇති වූ පුරප්පාඩුව සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12 (1)(ඇ) වගන්තිය ප්‍රකාරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයට වාසුකී ජෙයසංකර් මහත්මිය පත් කිරීමට සභාව විසින් නිර්දේශ කරන ලදී.

5.3. කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවට සාමාජිකයන් පත් කිරීම

ආචාර්ය රමණී දේවිකා ජයසුන්දර මහත්මියගේ ඉල්ලා අස්වීමත් සමඟ 2026.02.12 දින සිට කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ පූර්ණකාලීන සාමාජික සහ සභාපති ධුරයෙහි දැනට පවතින පුරප්පාඩුව දන්වමින්, ජනාධිපති ලේකම්වරයා වෙතින් ලැබුණු සන්නිවේදනය සභාව විසින් සලකා බලන ලදී.

ඒ අනුව, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 5 (2) සහ 5 (3) වගන්ති ප්‍රකාරව, කළමනාකරණ සහ පරිපාලන ක්ෂේත්‍රයෙහි දැනුම, පළපුරුද්ද සහ විශිෂ්ඨත්වය සහිත එම ධුරය සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන්ගෙන් එකී පුරප්පාඩුව පිරවීම සඳහා අයදුම්පත්/ නාමයෝජනා කැඳවීමට සභාව විසින් තීරණය කරන ලදී.

6. සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධ රීති සකස් කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඵ (3) ව්‍යවස්ථාව මගින් නියම කර ඇති පරිදි, සභාව විසින් එහි කාර්යයන් සහ කර්තව්‍යයන් කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද රීති නැවත සලකා බැලීමේ ක්‍රියාවලියේ යෙදී සිටියි.

7. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ යොමු කරනු ලබන තොරතුරු ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම

සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ පහත සඳහන් පරිදි තොරතුරු ඉල්ලීම් ලැබී ඇති අතර, ඒවාට ප්‍රතිචාර දැක්වීම ද පහත පරිදි සිදුකර ඇත:

ලැබුණු ඉල්ලීම් ගණන	2
තොරතුරු සම්පූර්ණයෙන්/අර්ධ වශයෙන් සපයා ඇති ඉල්ලීම් සංඛ්‍යාව	1
ප්‍රතික්ෂේප කරන ලද හෝ නිෂ්ප්‍රභා කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව	1
අභියාචනා සංඛ්‍යාව	2
ප්‍රතිචාර ලබා දී ඇති අභියාචනා සංඛ්‍යාව	0
ප්‍රතික්ෂේප කරන ලද අභියාචනා සංඛ්‍යාව	2